මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல.02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

**මාධ්‍ය නිවේදන අංක : PE/2024/73** **2024.11.12**

## පාර්ලිමේන්තු මැතිවරණය - 2024 නොවැම්බර් 14

### ආබාධ සහිත තැනැත්තන් මැතිවරණ ක්‍රියාවලියට අන්තර්කරණය කර ගැනිම සඳහා මැතිවරණ කොමිෂන් සභාව විසින් ලබා දී ඇති පහසුකම්

පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්වෙන දින, ආබාධ සහිත ඡන්දදායකයින් හට කිසිදු අපහසුතාවයකින් තොරව ඡන්දය ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබාදීම වෙනුවෙන් සියලු ඡන්ද මධ්‍යස්ථාන තුළ ආබාධ සහිත ඡන්දදායකයින් සඳහා මැතිවරණ කොමිෂන් සභාව විසින් පහත සඳහන් පහසුකම් සැපයීමට කටයුතු කර ඇත .

1. 2011 අංක 28 දරන මැතිවරණ (විශේෂ විධිවිධාන) පනත මගින් සංශෝධිත 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ ප්‍රධාන ප්‍රඥප්තියේ 40(2) උප වගන්තිය අනුව පූර්ණ හෝ අර්ධ දෘශ්‍යාබාධිත තත්ත්වයකට හෝ යම් ශාරීරික අශක්නුතාවයට (ආබාධ සහිත තත්ත්වයකට) පත් ඡන්ද හිමියකුට ඡන්දපොළේ දී ඡන්ද පත්‍රිකාව සලකුණු කර ගැනීම සඳහා සහායකයකු කැටුව යා හැකි වන පරිදි නීතිමය ප්‍රතිපාදන සලසා තිබීම.
2. 1981 අංක 01 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 83(4) (ඇ) ඡේදය අනුව, යම්කිසි කායික දුබලතාවයක් (ආබාධ සහිත තත්ත්වයක්) නිසා යම් තැනැත්තෙකුට පා ගමනින් හෝ වෙනත් පොදු ප්‍රවාහන සේවයක් මඟින් ඡන්දපොළට යාම සහ ඒම කළ නොහැකි නම් ඡන්ද පොළට යාම සහ ඒම සඳහා යම් වාහනයක් මඟින් ප්‍රවාහන පහසුකම් ලබා ගැනීම සඳහා ස්වකීය ඡන්ද විමසීම් ප්‍රදේශයේ තේරීම්භාර නිලධරයා හරහා අවසර ලබා ගැනීම.
3. කායික දුබලතාවයෙන් යුතු තැනැත්තන් (ආබාධ සහිත තැනැතැත්තන්) සඳහා ඡන්ද මධ්‍යස්ථානයට ඇතුළුවීමේ දොරටුවේ සිට ඡන්දපොළ පැවැත්වෙන ගොඩනැගිල්ල දක්වා මීටර් 100ට වඩා වැඩි දුරක් තිබේ නම් හෝ කඳු සහ පඩි විශාල සංඛ්‍යාවක් ඇති දුෂ්කර ඡන්ද මධ්‍යස්ථානවල, එම ගොඩනැගිල්ල දක්වා ත්‍රිරෝද රථ මඟින් ප්‍රවාහන පහසුකම් සැලසීම.
4. පූර්ණ හෝ අර්ධ දෘශ්‍යාබාධ සහිත ඡන්දදායකයින් හට තනිවම ඡන්දය සලකුණු කිරීම සඳහා ඡන්ද පත්‍රිකාව මඟපෙන්වන ස්පර්ශක රාමුව (Tactile Stencil Frame) භාවිත කිරීමට අවශ්‍ය පහසුකම් සලසා තිබීම.
5. මැතිවරණ කොමිෂන් සභාව විසින් ආබාධ සහිත තැනැත්තන් සඳහා නිකුත් කරන ලද තාවකාලික හැඳුනුම්පත ඡන්දය පාවිච්චි කිරීමේ දී අනන්‍යතාවය සනාථ කිරීමේ වලංගු අනන්‍යතා ලේඛනයක් (වලංගු හැඳුනුම්පතක්) ලෙස ඉදිරිපත් කළ හැකි වීම.
6. ඡන්දපොළ පරිශ්‍රය තුළ ප්‍රදර්ශනය කරන දැන්වීම්, සංඥා භාෂාවෙන් රූප සටහන් සහිතව ප්‍රදර්ශනය කර තිබීම.
7. මැතිවරණ කොමිෂන් සභාවේ නිල ඡන්ද ප්‍රතිඵල සජීවී විකාශනයේ දී සංඥා භාෂා පරිවර්තන සහිත ව විකාශනය කිරීම.
8. වෙනත් පොදු පහසුකම් හා ආබාධ සහිත තැනැත්තන්ට සපයා ගැනීමට අවසර දී ඇති පහසුකම්;
   - 8.1. ඡන්දපොළට පැමිණෙන ආබාධ සහිත ඡන්දදායකයින්ට කිසිදු බාධාවකින් තොරව ඡන්දය සලකුණු කිරීම සඳහා අවශ්‍ය සහාය ලබාදීම
   - 8.2. ඡන්ද සලකුණු කරන කුටිය තුළ ප්‍රමාණවත් ආලෝකය ලැබෙන ස්ථානයක ස්ථානගත කිරීම හෝ විදුලි අලෝකය සැපයීමට කටයුතු කිරීම
   - 8.3. ඡන්ද පෙට්ටිය තබන මේසය අඩු උස මට්ටමක තිබිම. (රෝද පුටු භාවිත කරන තැනැත්තන් සහ මිහිමිත් තැනැත්තන්ට පහසු වන සේ)
   - 8.4. අර්ධ දෘශ්‍යාබාධ සහිත තැනැත්තන් සඳහා අකුරු විශාලකර පෙන්වීමේ උපකරණ (අත්කාච, විශේෂ උපැස් යුවල් වැනි දෑ ) ඡන්ද මධ්‍යස්ථානයට රැගෙන ආ හැකි බැවින් ඒවා භාවිත කිරීමට අවසරය ලබා දීම
   - 8.5. ඡන්ද පත්‍රිකාව කියවා ගත නොහැකි තැනැත්තන් සහ පැහැදිලි කර දීමක් අවශ්‍ය වන තැනැත්තන් සඳහා අවශ්‍ය පරිදි පැහැදිලි කිරීම් සහ ඡන්දය සලකුණු කිරීම සඳහා ප්‍රමාණවත් කාලයක් ලබාදීම

එමෙන්ම ආබාධ සහිත ඡන්දදායකයින් වෙත කිසිදු බාධාවකින් තොරව ඡන්දය ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබාදීම වෙනුවෙන් මැතිවරණ රාජකාරිවල නියුතු ජ්‍යෙෂ්ඨ/ කණිෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් ඇතුළු සියලු නිලධරයන් වෙත මැතිවරණ කොමිෂන් සභාව විසින් ලබා දී ඇති උපදෙස් හා විධාන නිසි පරිදි අනුගමනය කරනු ඇති බව මෙයින් නිවේදනය කරමි.

ආර්.එම්.ඒ.එල්.රත්නායක
සභාපති, මැතිවරණ කොමිෂන් සභාව
(මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙනි)